**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය - 2018**

**---------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ("මණ්ඩලය") මූල්‍ය ප්‍රකාශන සහ මණ්ඩලයේ හා එහි පරිපාලිතයෙහි ("සමූහය")ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේවිධිවිධානප්‍රකාරමාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ හා සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව,මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (SLFRS) හි 25 වන වගන්තිය අනුව, අස්තිත්වයක් විසින් සියලුම මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් පන්ති සඳහා ධාරණ අගය හා සංසන්දනය කිරීමට ඉඩ ලැබෙන පරිදි සාධාරණ අගය හෙළිදරව් කළ යුතු වුවද මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මහ බැංකු බැඳුම්කර හා සංගමික ණයකර, පරිනතවීම තෙක් රදවාගත් මූල්‍ය ආයෝජන, ලෙස පවත්වා ගැනීම හේතුවෙන් ඒවාට අදාල සාධාරණ අගය හෙලිදරව් කිරීම් නොකරන ලද අතර ඉදිරියේදී හෙලිදරව් කිරීමට පියවර ගන්නෙමු. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය වත්කම්වල සාධාරණ අගය හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 (SLFRS 9) අනුව, ක්‍රමක්ෂය කළ පිරිවැය මත තබා ගන්නා මූල්‍ය වත්කම් (Financial Assets at Amortized cost) ක්‍රමක්ෂය කළ පිරිවැයට වාර්තා කළ යුතු වුවද, මණ්ඩලය විසින් රු. මිලියන 61,191 ක් වූ වත්කම් පිරිවැයට වාර්තා කර තිබුණි. | මහ බැංකු බැඳුම්කර යනු රජය විසින් ඇපවූ මූල්‍ය උපකරණයක් වීම හේතුවෙන් ද ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනය කිරීම හේතුවෙන් ද කෙරවලපිටිය බැඳුම්කරද රජය ඇපවූ මූල්‍ය උපකරණයක් වීම හේතුවෙන් ද ඒ සඳහා අපහායනය (impairment) අදාල නොවේ. ප්‍රති මූල්‍ය පහසුකමක් ලෙස පවත්වාගෙන යනු ලබන NDB, SMIB බැංකු මගින් සපයනු ලබන නිවාස මූල්‍ය පහසුකම සඳහා අදාල අපහායනයද ඉදිරියේදී කිරීමට කටයුතු කරන්නෙමු.ඉතිරි සියළු සේවක ණය අවුරුද්දකට වඩා අඩු කාලයකින් පියවීමට කටයුතු කිරීම හේතුවෙන් ඒ සඳහාද අපහායනය අදාල නොවේ. | ප්‍රමිත ප්‍රකාරව ක්‍රමක්ෂය කළ පිරිවැය මත තබා ගන්නා මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැයට වාර්තා කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 (LKAS 08) හි 28 වන වගන්තිය අනුව, 2018 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 යටතේ සිදුකල යුතු හෙළිදරව් කිරීම් මණ්ඩලය විසින් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරන්නෙමු. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 09 යටතේ සිදු කළ යුතු හෙළිදරව් කිරීම් කළ යුතු වීම. |
| (ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (LKAS 16) ප්‍රකාරව සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකළ යුතුවේ කෙසේ වුවද;2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පිරිවැය රු.502,896,000 ක් වූ ස්ථාවර වත්කම් තුළ වර්ෂ 25 කට අධික කාලයක සිට හීනවන ශේෂ ක්‍රමය යටතේ ක්ෂය කරමින් පවතින වත්කම් පැවතියද, එම වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා පියවර ගෙන නොතිබුණි. | ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 16 හි 30 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ දේපල, පිරියත හා උපකරණ පිරිවැය ආකෘතිය (Cost Model) යටතේ ගිණුම්ගත කරන බැවින් ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 16 හි 34 වන වගන්තිය අදාල නොවේ.එය අඛණ්ඩව පසුගිය වසර 37 ක් පුරාවට භාවිතා කර ඇත. | මණ්ඩලයේ වත්කම්වල සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකළ යුතු වීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් සේවාදායක ආයතනවලින් 1981 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුල අයකරගෙන තිබූ එකතුව රු.2,002,707,920 ක් වූ දායක මුදල්, අරමුදල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම් වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | 1981 වර්ෂයේ සිට 2017.12.31 දින දක්වා කාලය තුල දායක මුදල් ලෙස රු.මිලියන 196,948 ලැබී ඇති අතර, 2019.05.30 දිනට එක් එක් සාමාජිකයාගේ ගිණුම් වලට බැර නොකර සේවායෝජක ගිණුම්වල රඳවාගෙන ඇති සාමාජික මුදල් වල වටිනාකම රු. මිලියන 1,519 කි. මෙම වටිනාකම ලැබී ඇති සාමාජික මුදල් වටිනාකමින් ප්‍රතිශතයක් ලෙස ගත්කල 0.77% වේ.<br>ඊට අමතරව සේවායෝජකයින් සේවක විස්තර ලබා නොදීම, ආයතන කිහිපයක් සඳහා එක් චෙක්පතක් මගින් සාමාජික මුදල් ගෙවා ඇති අවස්ථා වලදී විභජනය කළ යුතු ආකාරය අපැහැදිලි වීම, ආයතන විසින් ලබාදෙනු ලබන අර්ධ වාර්ෂික වාර්තාවල ඇතුලත් දත්ත අපැහැදිලි වීම ආදි විවිධ හේතුමත සාමාජික ගිණුම්වලට | දායක මුදල් බැරවිය යුතු සාමාජිකයන් නිවැරදිව හා කඩිනමින් හඳුනගත හැකි ආකාරයට සාමාජික මුදල් අයකිරීමේ ක්‍රමවේදය වැඩි දියුණු කර ගැනීම හා හඳුනා නොගත් සාමාජික මුදල් කඩිනමින් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතු වේ. |

සාමාජික මුදල් බැර කිරීම ප්‍රමාද වී ඇත.

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත | අතිකාල සඳහා ගෙවීම් කිරීමේදී අතිකාල පැයකට සාමාන්‍ය පැයක වැටුප මෙන් එක හමාරක් පමණක් ගෙවිය යුතු වුවද මණ්ඩලය විසින් සෙනසුරාදා/ඉරිදා දිනවල අතිකාල පැය 8 ක් සම්පූර්ණවීමත් සමග අතිකාල දීමනාවලට අමතරව දිනක වැටුපක් ද එකතු කර අතිකාල ගෙවීම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී අතිකාල පිරිවැය රු.18,615,000 ක් වී තිබුණි. තවද පනත ප්‍රකාරව අතිකාල ලබා ගැනීමට මණ්ඩලයේ නිලධාරීන් සතියකට දින පහමාරක් සේවය කළ යුතු වන අතර වාර්ෂික නිවාඩු දින 21 කට පමණක් සීමාකර තිබුණද ඊට පටහැනිව නිලධාරීන්ට වාර්ෂික නිවාඩු 42 ක් ලබාදීම හා සතියකට දින 5 ක සේවයක් ඉටු කිරීමට ඉඩ දී තිබුණි. | මණ්ඩලය පිහිටවූ කාලයේ සිටම අතිකාල ගණනයේදී පැයට පැය 1 ½ බැගින් අතිකාල ගණනය කිරීමටත් ඊට අතිරේකව පැය 8 ක සේවය සඳහා දිනක වැටුප ලබාදීමත් සිදුකර ඇත. ඒ අනුව පසුගිය වර්ෂ 37 පමණ කාලයක් භුක්ති විඳි ක්‍රමවේදයක් වෙනස් කිරීම කාර්මික සාමය බිඳවැටීමට හේතුවක් වියහැකි බව සඳහන් කරමි.<br>සාප්පු කාර්යාල පනත අනුව අතිකාල ගණනය කිරීම සඳහා සතියකට පැය 45 ක කාලයක් සේවයක් කළ යුතු වීම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන්නකි. දින පහක සේවා කාලය තුල තේ විවේක ගැනීම හෝ දිවා ආහාරය සඳහා පැය ½ ට අඩු කාලයක් ගෙන ඉතිරි කාලය සේවය සඳහා යෙදවීම තුලින් සතියේ වැඩකරන දින 5 තුළින් සෙනසුරාදා වරුවකට නියමිත වැඩ ප්‍රමාණය ආවරණය කිරීම සිදුකෙරේ. ඒ අනුව සෙනසුරාදා සම්පූර්ණ දිනය සඳහා ද අතිකාල ගෙවීම් සිදු කෙරේ. | සාප්පු හා කාර්යාල සේවක පනත අදාල වන ආයතනයක් ලෙස අතිකාල හා නිවාඩු සම්බන්ධයෙන් එම පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 14,848 ක් හා මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 14,851 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ සමූහයේ හා මණ්ඩලයේ ලාභ පිළිවෙලින් රු.මිලියන 17,153 ක් හා රු.මිලියන 16,828 ක් විය. ඒ අනුව සමූහයේ හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිළිවෙලින් රු.මිලියන 2,305 ක හා රු.මිලියන 1,977 ක පිරිහීමක් නිරීක්ෂණ විය. මෙම පිරිහීමට 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත යටතේ බදු අනුපාතයන්ගේ ඉහල යෑම හේතුවෙන් මණ්ඩලයේ ආදායම් බදු වියදම රු.මිලියන 689 කින් එනම්, සියයට 25 කින් ඉහල යෑම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පැවතෙන හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු.12,475,760 ක් සහ 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු.7,803,642 ක් හා ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ රු.3,926,732 ක් වශයෙන් එකතුව රු. 24,206,134 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සාමාජිකයින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 මුල් මාස හතර තුළදී 05 දෙනෙකු වෙත මරණ ප්‍රතිලාභ ගෙවා ඇති අතර එදිනට උරුමකරුවන්ට ගෙවීමට ඇති ශේෂය රු.12,380,049 කි.<br>හිමිකරුවන් 91 දෙනෙකුට ආපසු එවන ලද ප්‍රතිලාභ රු. 3,634,767 ක් එම කාලයට අදාලව ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇති අතර, 2019.04.30 දිනට ගෙවීමට ඇති ශේෂය රු. 4,168,874 ක් වේ.<br>ඉල්ලුම් නොකල ප්‍රතිලාභ (Return Benefits – Welfare) ගිණුමේ අයදුම්කරුවන් 101 දෙනා අතරින් ප්‍රතිලාභීන් එක් අයෙකු වෙනුවෙන් රු.99,975 ක (2019 ජනවාරි මස සිට 2019 අප්‍රේල් 30 දක්වා) මුදලක් නැවත ගෙවීම් කර ඇති අතර නොගෙවූ ප්‍රතිලාභ තවදුරටත් 2019.04.30 දිනට ගෙවීමට ඇති වටිනාකම රු. 988,873 ක් වේ. | නිරවුල් නොකර පවතින හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ, රඳවාගත් ප්‍රතිලාභ හා ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ වෙන් වෙන්ව හඳුනාගෙන නිරවුල් කිරීමට සුදුසු වැඩපිළිවෙලවල් සකස් කිරීම කළමනාකරණයේ වගකීම වේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2012 වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සියයට 87 ක්ද, උපරිම කොටස් ආයෝජන සියයට 6 ක් ද, වෙනත් ස්ථාවර සුරැකුම් හා කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්වල ආයෝජනය සියයට 7 ක්ද ලෙස ආයෝජන කළඹ තීරණය කර තිබුණි. එහෙත් ආයෝජන ප්‍රකාශය පිළිබඳව විධිමත් සමාලෝචනයක් හා සංශෝධනයක් සිදුනොකර රජයේ සුරැකුම්පත් වල ආයෝජනය 2016 වර්ෂයෙන් පසු | මණ්ඩලය විසින් විධිමත් ආයෝජන ප්‍රතිපත්තියක් පිළියෙල කර ඇත්තේ 2012 දීවන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. පසුකාලීනව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයන් අනුව රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල කරනු ලබන ආයෝජන, ආයෝජන ප්‍රතිපත්තියේ සියයට පහක කොටසෙන් පරිබාහිරව සැලකීමට තීරණය කරන ලදි. තවද 2017 වසරේ සිට ලංකාවේ විශාලතම රාජ්‍ය බැංකු තුනෙහි ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සීමාවන් තුලය. ඒ අනුව සියයට 87 ක අවම ප්‍රතිශතය රාජ්‍ය සුරැකුම්පත් හා රාජ්‍ය | විධිමත් ආයෝජන ප්‍රතිපත්තියකට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| අඩුකර තිබූ අතර ඒ වෙනුවට ස්ථාවර තැන්පතු ආයෝජන වැඩිකර තිබුණි. 2016, 2017 හා 2018 වර්ෂවලදී සුරැකුම්පත් ආයෝජන පිළිවෙලින් සියයට 86 ක්, සියයට 79 ක් හා සියයට 76 ක් වී තිබුණු අතර වෙනත් ස්ථාවර සුරැකුම්පත්හි ආයෝජන පිළිවෙලින් සියයට 8 ක්, සියයට 15 ක් හා සියයට 19 ක් වී තිබුණි. ඒ අනුව, කෙටිකාලීන කල්පිරීම් සහිත සුරැකුම්පත්හි ආයෝජනය ඉහළ යැමත් අඩු අවදානම් සහිත රජයේ සුරැකුම්පත්හි ආයෝජනය පහළ යැමත් සමස්ත ආයෝජන කළඹේ අවදානම ඉහළ යාමට හේතු විය හැකි බව නිරීක්ෂණය විය. | බැංකුවල ස්ථාවර තැන්පතුවල එකතුව ලෙස සලකයි.<br><br>ආයෝජන ප්‍රතිපත්තිය අනුමත කර ඇත්තේ අධ්‍යක්ෂක මණ්ඩලය විසිනි. කාලීන අවශ්‍යතාවයන් මත එය සංශෝධනය කරනු ලබන්නේද අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිවය. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ආයෝජන ප්‍රතිපත්තියට කරනු ලබන සංශෝධනවලට අනුව කරනු ලබන ආයෝජන, ආයෝජන ප්‍රතිපත්තියට අනුව කරනු ලබන ආයෝජන ලෙස හඳුනා ගත යුතුය. | |
| (ආ) මණ්ඩලය විසින් ප්‍රාථමික හා ද්විතියික වෙළඳපොළ හරහා මිලට ගනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර "පරිණත වීම තෙක් රඳවාගන්නා බැඳුම්කර" ලෙස වර්ගකර පවත්වා ගන්නා බැවින් ඒවා ද්විතියික වෙළඳපොළ තුළ විකිණීමෙන් ලබාගත හැකි මූල්‍ය වාසි අත්කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | අරමුදලට ඇත්තේ දිගුකාලීන දැක්මකි. ඒ අනුව බැඳුම්කරය කල් පිරෙන තෙක්තබා ගැනීමෙන් ඉහළ පොලී අනුපාතය මණ්ඩලයට ලැබේ. ඉහළ පොලී සහිත බැඳුම්කර විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ලැබීමට නම් එම පොලී අනුපාතයට වඩා වෙළඳපොල පොලී අනුපාත අඩුවිය යුතුය. එසේ පොලී අනුපාත අඩු අවස්ථාවලදී පමණක් ලාභ ලැබීම සඳහා විකිණිය යුතුය. එවිට ලාභයක් ලැබෙන නමුත් විකිණීමෙන් ලැබෙන මුදල් නැවත අඩු පොලී සහිත බැඳුම්කරවල ක්ෂණිකව ආයෝජනය කිරීමට සිදුවේ. මෙවැනි තත්ත්වයක් දිගටම ඇති වුවහොත් අරමුදලෙහි ඉතිරි වනුයේ අඩු පොලී සහිත බැඳුම්කර පමණි. යම් උපායමාර්ගික අවස්ථාවලදී පමණක් එසේ විකිණීමක් කල හැකි වුවද ප්‍රතිශතයක් ලෙස දිගුකාලීනව කිරීම නොගැලපෙන කාර්යයකි. | භාණ්ඩාගාර බැඳුම්කර වලින් කොටසක් ද්විතියික වෙළඳපොල ගනුදෙනු සඳහා පවත්වා ගැනීමෙන් ඒවා විකිණීමෙන් මූල්‍ය වාසි අත්කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවීම. |
| (ඇ) මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙළේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසි වලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම(Direct Bidding Facility)2018 දෙසැම්බර් 31 දින වනවිටත් ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මහ බැංකුවෙන් නිරන්තරයෙන්ම ඉල්ලීම් කර ඇති අතර Direct Bidding Facility ලබා ගැනීමට අවශ්‍ය පරිසරය සකසා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | සෘජු මිල ගණන් ඉදිරිපත් කිරීම් පහසුකම ලබාගැනීම මගින් මණ්ඩලයට වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2016 වර්ෂයෙන් පසුව මණ්ඩලය විසින් භාණ්ඩාගාර බැඳුම්කර ද්විතියික වෙළඳපොල ගනුදෙනු වලින් ඉවත් වී තිබූ අතර 2018 දෙසැම්බර් 31 දින වන විටත් නැවත ද්විතියික වෙළඳපොල ගනුදෙනුවලට අවතීර්ණ වී නොතිබුණි. මේ හේතුවෙන් අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ ගැටළුකාරී තත්වයක් පවතින බවත් ඒ හේතුවෙන් ආයෝජන කළඹ හැසිරවීමේදී අවදානම අඩු රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ අවස්ථාව අහිමි වන බවත් අනාවරණය විය. | ඒ අනුව අදාල සේවකයන් බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇති මුත් මේ දක්වා අවශ්‍යතාවයට ගැළපෙන පරිදි අනුමැතිය ලැබී නොමැත. තවද, අතීතයේදී මෙන් නොව වර්තමානයේ මහ බැංකුව විසින් සෑම මසකම ප්‍රාථමික වෙළඳපොලේ බැඳුම්කර නිකුත් කරනු ලබයි. ඒ අනුව ඍජුවම ප්‍රාථමික වෙළඳපොල හරහා බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවස්ථාව පුළුල් වී ඇත. | භාණ්ඩාගාර බැඳුම්කර ද්විතියික වෙළඳපොල ගනුදෙනු වලට නැවත අවතීරණ වීම හා ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම්, අභ්‍යන්තර පාලනය හා මානව සම්පත් සංවර්ධනය කිරීම සිදු කළ යුතුය. |

**3.3 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල විසින් 2017 හා 2018 වර්ෂයන් සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් තොරව 2016 වර්ෂයේදී තෝරාගත් ආයතනයෙන්මකුලී පදනම මත වාහන ලබාගෙන තිබුණි. ඒ අනුව එම වර්ෂ දෙක සඳහා පිළිවෙලින් කුලී පදනම මත ලබාගත් වාහන16 ක් හා 15 ක් වෙනුවෙන් පිළිවෙලින් රු.8,386,279 ක් හා රු.7,683,335 ක් ගෙවා තිබුණි. | වසර 10 ට වඩා පැරණි ධාවනයේ යෙදෙමින් තිබූ වාහන 07 ක් අපහරණය කරන ලදි.<br>ඒ හේතුවෙන් වාහන කිහිපයක් තාවකාලික කුලී පදනම මත ලබා ගැනීමට තීරණය වූ අතර, මෙය වාහන පිළිබඳ ස්ථිර විසඳුමක් ලැබෙන තෙක් පමණක් ක්‍රියාත්මක කිරීම මණ්ඩලයේ අදහස විය. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ 2016.01.28 දිනැති පත්‍රිකා අංක 652 යටතේ වාහන කුලී පදනම යටතේ ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගන්නා ලදි.<br>ඒ අනුව, අඩු මිලට වාහන සපයන වාහන කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුගෙන් මිල ගණන් කැඳවන ලද අතර, එයින් අපගේ අවශ්‍යතාවයට සරිලන පරිදි අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ මිලට වාහන කුලියට ලබා ගන්නා ලදි. 2019 වර්ෂයේදී මණ්ඩලයේ අවශ්‍යතා අනුව වාහන මිලදී ගන්නා තෙක් ඉතාමත් අඩු මිලකට වරින් වර වාහන කුලී පදනම මත ලබා ගන්නා ලදි. වර්තමානය වන විට මණ්ඩලයේ සියළුම වාහන අවශ්‍යතා පිරිමසා ඇති බැවින් මෙසේ කුලී පදනම මත වාහන ගැනීම මුළුමනින්ම නවතා ඇත. | මණ්ඩලයට සේවාවන් ලබාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන හා මඟපෙන්වීම් අනුව කාලීනව ප්‍රසම්පාදන කටයුතු ඉටුකළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

### 4.1 සංයුක්ත සැලැස්ම

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 වර්ෂයේ පමණ සිට සංයුක්ත සැලැස්ම අනුව තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉලක්ක කළ පරිදි වර්තමානයේ පවතින සාමාජික ගිණුම් කළමනාකරණ පද්ධතිය හා අනෙකුත් මෘදුකාංග පද්ධතිය පිළිබඳව අධ්‍යනය කර නව මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කිරීම සහ ආපදා වලක්වා ගැනීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් 2018 වර්ෂය අවසන් වන විටත් ඉටු කර නොතිබුණි. | අවුරුදු 18 ක් පමණ පැරණි දැනට පවතින පරිගණක පද්ධතිය කුමන ආකාරයෙන් වෙනස් කල යුතුද යන්න ICTA ආයතනය සිදුකරන ව්‍යාපාර ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමේ අධ්‍යානයෙන් (Business Process Improvement Study) පසුව සිදුකිරීමට කළමනාකාරිත්වය තීරණය කරන ලදි. එබැවින්, පරිගණක පද්ධතියේ ප්‍රතිව්‍යූහගත කිරීම හා වැඩිදියුණු කිරීම 2016 වර්ෂයේ දී සිදුකිරීමට නොහැකි විය.<br>මෙම අධ්‍යානය ICTA මගින් MG Consultant ආයතනය ලවා සිදුකර 2018 මැදභාගයේදී අවසන් කරන ලදි. ඉන් පසුව අලුත් පරිගණක පද්ධතිය නිර්මානය කිරීම ICTA මගින් INNOVA ආයතනය වෙත බාරදී ඇති අතර, එම වැඩ කටයුතු දැනට කඩිනමින් සිදුකිරමින් පවතී.<br>ඒ අනුව, 2020 වර්ෂයේදී නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි මණ්ඩලයේ සියළුම පහසුව සැලසෙන පරිදි රජයේ පූර්ණ අනුග්‍රහය ඇති පරිගණක පද්ධතියක් හඳුන්වාදීමට වැඩ කටයුතු කරමින් පවතී.<br>තවද ආපදා වලක්වා ගැනීමේ සැලසුම 2016 වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවත් නව පරිගණක පද්ධතියට ගැලපෙන පරිදි එම ආපදා වළක්වා ගැනීමේ සැලසුම්ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩකටයුතු 2019/2020 වර්ෂ වලදී ආරම්භ කර ඇත. | සංයුක්ත සැලැස්ම තුළ දක්වා ඇති අරමුණු හා කාර්යයන් ඉටු කිරීමට කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී ස්වයංරැකියාලාභීන් 880 ක් සාමාජික කර ගැනීමට සැලසුම් කර තිබුණද සාමාජිකත්වය ලබාදී තිබුණේ ස්වයං රැකියාලාභීන් 354 දෙනෙකුට පමණක් විය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව අප පනතේ ප්‍රකාර ස්වයං රැකියා හා විගමණිකයින් බඳවා ගැනීම් සැලසුම් කර තිබුන ද එහි ස්වේච්ඡාවෙන් සාමාජිකත්වය ලබා ගන්නේ ඉතා සුළු පිරිසකි. 2019 වර්ෂයේ මෙම බඳවාගැනීම් කාර්යක්ෂම කර ඇති අතර ජුනි 30 වන දිනට සාමාජිකයන් 668 ක් බඳවාගෙන ඇත. ඉදිරියේදී ද වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමට කටයුතු පිළියෙල කරමින් පවතින බැව් දන්වා සිටිමි. | ක්‍රියාකාරී සැලැස්ම තුළ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු වීම. |

**4.3** රාජ්‍ය ගිණුම්කාරක සභා නිර්දේශ හා වර්තමාන තත්ත්වය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාපිත පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයාම වන්නේය. කෙසේ වුවද මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා එහි සභාපතිවරයාම විය යුතු බවට වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5(2) වගන්තිය සංශෝධනය කල යුතු බවට 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී නිර්දේශ කර තිබුණි. එසේ වුවද,2018 වර්ෂය අවසන් වනවිටත් පනතට අවශ්‍ය සංශෝධනය සිදුකිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතට අවශ්‍ය කාලීන සංශෝධන සිදුකිරීමට මණ්ඩලය කටයුතු කළ යුතු වීම. |

**4.4** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම සමග ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව, ලැයිස්තුගත කොටස්, ලැයිස්තුගත නොවන කොටස් හා ස්ථිර ආදායම් සහිත ආයෝජනයන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී එම කටයුතු ඉටුකර නොතිබුණි.<br><br>(ආ) මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලයේ ප්‍රසම්පාදන කටයුතු, වාහන අලුත්වැඩියා හා ගොඩනැගිලි කුලී සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට සහ අවදානම් තක්සේරු කිරීමේ ලේඛනය පවත්වාගෙන යැමට සැලසුම් කර තිබුණ ද සැලසුම් කළ පරිදි කටයුතු කර නොතිබුණි. | පූර්ව විගණන කටයුතු වලට අමතරව දායක මුදල් එක්රැස් කිරීම හා බැංකුගත කිරීම, ප්‍රාදේශීය කාර්යාල විගණනය, මාසික බැංකු සැසඳුම් වාර්තා, දායකත්වය හා අධිභාර ආදායම් ප්‍රගතිය 2017, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2016, වාහන හා පාපැදි මිලදී ගැනීම සඳහා ණය ආදි විගණනයන් 2018 වර්ෂයේදී සිදුකර ඇත.ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ කොටස් පිළිබඳ විගණනය 2019 වර්ෂයේදී සිදුකිරීමට සැලසුම් කර තිබේ. අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ කමිටු පත්කොට තිබෙන අතර, ඒ අනුව ඉදිරි වැඩකටයුතු කෙරෙමින් පවතී. | ක්‍රියාකාරී සැලැස්ම තුළ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීමට අභ්‍යන්තර විගණන අංශය විසින් කාර්යක්ෂම හා ඵලදායී ලෙස කටයුතු කළ යුතු වීම. |

**4.5 තිරසාර සංවර්ධන අරමුණු**

**-----------------------------**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **-------------------------** | **-----------------------------------** | **-------------** |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට මේ පිළිබඳව අධ්‍යයනය කරමින් පවතින අතර ඉදිරියේ දී මණ්ඩලයට අදාල ඉලක්ක හදුනාගැනීමට නියමිතය. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය"ට අනුකූලව ආයතනය විසින් කටයුතු කළ යුතු වීම. |